**ශීර්ෂය 135 වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 16 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 සැප්තැම්බර් 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරීවෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021දෙසැම්බර් 31 දිනට වැවිලි කර්මාන්තඅමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) මෙම වාර්තාවේ ඡේද අංක 2.3 (අ) සහ 3.3 මගින් දක්වා ඇති නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේදී මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1992 වර්ෂයේදී රජයට අයත් එකතුව හෙක්ටයාර් 249,843 ක් වූ ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් 23 ක් වෙත අවුරුදු 53 ක කාලයක් සඳහා බදු කුලී පදනම මත පවරා දී තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට එම සමාගම් අතරින් සමාගම් 09 කින් රජයට අයවිය යුතු රු.886,412,196 ක බදු ආදායම හිඟව තිබුණුඅතර, මු. රෙ. 176 (2) ප්‍රකාරව භාණ්ඩාගාරය හා එක්ව අප්‍රමාදව හිඟ හිටි ආදායම් එකතු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ප්‍රධානත්වයෙන් අදාළ වැවිලි සමාගම් සමඟ සාකච්ඡා පවත්වා හිඟ බදු මුදල් ගෙවන ලෙස දන්වා ඇත. වැඩිම බදු මුදලක් ඇති කොටගල වැවිලි සමාගම විසින් 2017 වර්ෂයේ සිට බදු මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින්, හිඟ බදු මුදල් අයකර ගැනීම සඳහා ගරු නීතිපති වෙත දන්වා නෛතික ක්‍රියාමාර්ග ගන්නා මෙන් බදු දීමනාකරු වන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව හා ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත 2021 අගෝස්තු 04 දින ලිඛිතව දක්වා ඇත. | හිඟ බදු ආදායම් අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | 1995 නොවැම්බර් 27 දිනැතිව කුරුණෑගල වැවිලි සමාගම සමඟ ඇතිකරගත් අංක 1558 දරන කල් බදුකුලී සංශෝධත ගිවිසුම අනුව එදිනට පැවති ශුද්ධ වත්කම් ප්‍රමාණයමත ගණනය කළ බදු මුදල වසර 53 ක් තුළ වසරකදී සමාන වාරික හතරකින් ගෙවිය යුතුය.ශුද්ධ වත්කම් අඩුවීම මත වසරකට ගෙවිය යුතු බදු මුදල අඩුවෙන් ගෙවීම නිසා2021 දෙසැම්බර් 31 දිනට රු.255,112,417 ක් කුරුණෑගල වැවිලි සමාගමෙන් අයවිය යුතු කුලිය වන අතර, එයින්, රු.116,801,733 ක් වසර 05 කට වැඩි කාලයක සිට හිඟව පැවත තිබුණු බව නිරීක්ෂණය විය. මෙම සමාගම සමඟ ඇති කර ගෙන තිබුණු කල් බදු සංශෝධන ගිවිසුමෙහි 2(a) ඡේදය අනුව එහි සඳහන් නියමිත දිනයන්ට අඛණ්ඩව බදු කුලිය ගෙවීම සඳහා එම සමාගම | කුරුණෑගල වැවිලි සමාගම විසින් ඔවුන් අනුගමනය කරනු ලබන ක්‍රමවේදය යටතේ අඛණ්ඩව බදු කුලිය ගෙවීම් කර ඇති අතර බදු පැහැර හැරීමක් සිදු කර නොමැත. කුරුණෑගල වැවිලි සමාගම විසින් බදු මුදල් ගෙවීම් සිදු කරනු ලබන්නේ වෙනස්වන ශුද්ධ වත්කම් වටිනාකම පදනම්ව වූ ක්‍රමවේදයක් යටතේ වන බැවින්, ඇස්තමේන්තු මුදලට වඩා අඩු මුදලක් ගෙවනු ලැබේ. එබැවින් එම සමාගම විසින් නියමිත බදු මුදලින් කොටසක් හෝ ගෙවන බැවින් 5C ඡේදය අනුව කටයුතු කළ හැකිද යන්න ගරු නීතිපති වෙතින් විමසීම් සිදු කළ යුතුව ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| | එකඟ වී තිබුණද, වසර ගණනාවක සිට එම කොන්දේසිය කඩ කර තිබුණු බව නිරීක්ෂණය විය. එසේ නමුත් මෙම ගිවිසුමෙහි 5(c) ජේදය අනුව දින 07 ක් ඇතුළත දැන්වීමක් ඉදිරිපත් කර බදු ගිවිසුම අහෝසි කළ හැකිව ඇතත් ඒ අනුව කටයුතු කර නොමැත. | | |
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනයේ සියයට 20 ක උප බදු දීම සම්බන්ධව මූලික ඇස්තමේන්තු වටිනාකම ඇතුළත් කර නොතිබුණු අතර උප බදු ආදායම රැස්කිරීම් ලෙස රු.10,007,674 ක් පමණක් ඇතුළත් කර තිබුණි. එසේම උප බදු ලබාදුන් ආයතන 09 කින් රු.2,656,509 ක් හිඟ මුදලක් පැවති අතර එම වටිනාකම හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | එකඟවේ. | හිඟ බදු, හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කිරීමට පියවර ගත යුතුය. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් **08** ක් සඳහා සලසා තිබුණු එකතුව රු. 124,**8**01,000 ක ප්‍රතිපාදනවලින්, එකතුව රු.33,515,850 ක් උපයෝජනය කර නොතිබුණි. ඒ අනුව වර්ෂය අවසාන වන විට එම වැය විෂයන්වල ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට **17** සිට සියයට 100 දක්වා සැලකිය යුතු පරාසයක පැවති බව නිරීක්ෂණය විය. ඒ අනුව වියදම් ඇස්තමේන්තු තාත්විකව පිළියෙල කිරීම පිළිබඳව අමාත්‍යාංශයේ අවධානය යොමු වී නොමැති බව නිරීක්ෂණය විය. | එකඟවේ. | සලසාගත් ප්‍රතිපාදන නිසිපරිදි උපයෝජනය කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය විෂයයන් 05 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.102,730,000 ක ප්‍රතිපාදනවලින්,එකතුව රු.22,993,900ක් උපයෝජනය කර නොතිබුණි. ඒ අනුව වර්ෂය අවසාන වන විට එම වැය විෂයන්වල ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 100 දක්වා සැලකිය යුතු පරාසයක පැවති බව නිරීක්ෂණය විය. | එකඟවේ. | සලසාගත් ප්‍රතිපාදන නිසිපරිදි උපයෝජනය කළ යුතුයි. |

## 2.3 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ---------------------- | ---------- |
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට භාණ්ඩාගාර පොත් හා අමාත්‍යාංශ පොත් අතර පැවති රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් ශේෂය රු. 56,769 ක වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතුය. |
| (ආ) | අමාත්‍යංශයෙන් බැහැරව ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරීන් 04 දෙනෙකුගෙන් මාස 06 සිට අවුරුදු 31 ත් අතර, කාලයක සිට අය නොවී පවතින එකතුව රු.140,868ක ණය ශේෂ විගණිත දිනය වන විටත් නිරවුල් කර නොතිබුණි. | 20 වසරකටත් වඩා ඉහත කාලයක සිට නිරවුල් නොවී පවතින මෙම ණය ශේෂයන්ට අදාළ නිලධාරීන් සම්බන්ධව තොරතුරු ඔවුන් ස්ථාන මාරුවී ගිය ආයතනයන්ගෙන් විමසුවද ඔවුන් පිළිබඳ තොරතුරක් සොයා ගැනීමට නොහැකි විය. | ණය ශේෂ කඩිනමින් නිරවුල් කර ගත යුතුය. |
| (ඇ) | වැඩ තහනම් කර ඇති නිලධාරියෙකුගෙන් වසර 7 ක කාලයක සිට රු.41,790 ක ශේෂයක් හා නිලධාරීන් 3 දෙනෙකුගෙන් වසර 12 ත් 24 ත් අතර කාලයක සිට රු.398,511 ක ශේෂයක් ලෙස එකතුව රු.440,301 ක් වූ ශේෂ සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | වැඩ තහනම් කර ඇති නිලධාරියාගේ ණය අයකර ගැනීම සිදුකරනු ලැබේ. සේවය හැරගිය නිලධාරීන් 03 ක් සිටින අතර එක් නිලධාරියකුගේ දේපල ණය ශේෂය අයකර ගැනීමට එම ඉඩම වෙන්දේසි කිරීමට කටයුතු කරනු නොලැබේ. එක් නිලධාරියකු මියගිය ඉව දක්වා තිබෙන බැවින් ණය අත්හැරීමටත් අනිත් නිලධාරියාගේ ණය ශේෂය | ණය ශේෂ කඩිනමින් නිරවුල් කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අයකර ගැනීමට අධිකරණ ක්‍රියාමාර්ග සිදුකරනු ලැබේ. | |
| (ඇ) | විශ්‍රාම ලැබූ නිලධාරියකුගෙන් අයවිය යුතු රු.133,569 ක් අවුරුදු 02 ක් ගතවී තිබුණද අයකර ගෙන නොතිබුණි. | නිලධාරියාගේ ලිපි ගොනුව විනය ක්‍රියාමාර්ග ගැනීම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යවා ඇත. | -එම- |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශය විසින් පරිපූරක ඇස්තමේන්තුවක් මගින් හෝළුවාගොඩ වැව්ලි පාරිසරික තාක්ෂණික උද්‍යානය සංවර්ධනයට රු.100,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි.මෙම සංවර්ධනය කිරීම අදියර දෙකකින් සිදු කිරීමට තීරණය කර තිබුණු අතර ඒ සඳහා රු.98,193,915 කටපිරිනමා තිබුණු කොන්ත්‍රාත්තුව 2022 ජූලි 30 දින අවසන්විය යුතුව තිබුණි. කෙසේවුවද, 2022 වර්ෂයේ ජූනි 30 දින වනවිට සම්පූර්ණ වියදම රු.76,524,519 ක් වී තිබුණු අතර නිශ්චිත කාලපරිච්ඡේදය තුළ මෙම ඉදිකිරීම් අවසන් කිරීමට නොහැකිව තිබුණි. | කොන්ත්‍රාත්තුව දීර්ඝ කරදීමට පියවර ගන්නා ලෙස නාගරික සංවර්ධන අධිකාරියට ලිඛිතව දැනුම් දී ඇත. | සංවර්ධන කටයුතු නිශ්චිත කාලපරිච්ඡේදය තුළඅවසන් කළ යුතුය. |

**3.2 වත්කම් කළමණාකරනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | වැවිලි අමාත්‍යාංශයට අයත්රු.6,090,000 ක පිරිවැයක් වූ අංක PC – 6259 දරන කැබ් රථය ස්ථාවර වත්කම් ලේඛනයේ දෙවරක් සටහන් වී තිබුණි. | මෙම වර්ෂයේදී වත්කම් ලේඛනය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදි කළ යුතුය. |
| (ii) | වැවිලි අමාත්‍යාංශය විසින් 2017වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා පිරිවැය රු.43,000,000 ක් වටිනාකමැති වාහන 05ක් වෙන්දේසි කර තිබුණු අතර, එම වටිනාකම මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙන් ඉවත් කර ගෙන නොතිබුණි. | එකඟ වේ. | වත්කම් ප්‍රකාශනය නිවැරදි කළ යුතුය. |
| (iii) | අමාත්‍යාංශය දැනට භාවිතා කරන වාහන 05 ක සහ ජනාධිපති ලේකම් කාර්යාලයෙන් අමාත්‍යාංශය වෙත ලැබුණු වාහන 03 ක පිරිවැය ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | එකඟ වේ. | ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදි කළ යුතුය. |
| (iv) | පිරිවැය රු.215,790,000 ක් වූ වාහන 26 ක් අමාත්‍යාංශය විසින් අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය වැවිලි සංස්ථාව, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය ඇතුළු ආයතනවලට සහ මුදල් අමාත්‍යාංශයට ලබා දී තිබුණද එම වාහනවල වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කර නොතිබුණි. | එකඟ වේ. | -එම- |

**3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසියේ 880(i) සහ රජයේ නිලධාරීන්ගේ ඇප පනතේ 612 වැනි අධිකාරිය ප්‍රකාරව අමාත්‍යාංශයේ ඇප තැබිය යුතු නිලධාරීන් සංඛ්‍යාව හඳුනාගෙන ඇප තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි.තවද මුදල් රෙගුලාසි 891 (i) ප්‍රකාරව සේවක ඇප තැන්පත් ලේඛනයක් පවත්තා නොතිබුණි. | ඇප ඉල්ලුම්පත්‍ර 2022 පෙබරවාරි 03 වැනි දින රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය ඇපකාර සංගමය වෙත යැවූ අතර, එහි සංශෝධන කිහිපයක් කරන ලෙස දන්වා ඇප ඉල්ලුම්පත්‍ර ඇපකාර සංගමය විසින් ආපසු එවා ඇත. සංශෝධිත ඇප ඉල්ලුම්පත්‍ර නැවත ඇපකාර සංගමය වෙත යැවීමට කටයුතු සූදානම් කර ඇත. | මු.රෙ. ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.4 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අලාභහානි සිදු වී වර්ෂ 01 ක සිට වර්ෂ10ක් අතර පරාසයක කාලයක් ගත වී ඇති සිද්ධීන් 09 ක් සම්බන්ධයෙන් එකතුව රු.5,092,692 ක් වූ පාඩු හා හානිවීම් අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | එකඟවේ. | පාඩු හා හානිවීම් අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කළ යුතුය. |

**4. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 593 වූ අතර එයින් 147 ක් පුරප්පාඩු හා අතිරික්ත 03 ක්ද පැවතුණි. මේ අනුව සුදුසු පරිදි තනතුරු පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනයට පියවර ගෙන නොතිබුණි . | එකඟවේ. | මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට පියවර ගත යුතුය. |